ගාල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා, 1973 ජනවාරි මස 1 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව, ගාල්ල නගර සභා සීමාවට ඇතුලත් වන ප්‍රදේශය හැර ගාල්ල පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥාපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

මොණරාගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත, එස්. ජේ. සුමනසේකර බණ්ඩා මහතා, 1973 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මොණරාගල පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥාපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

බී. මහාදේව,
ලේකම්.

1973 පෙබරවාරි 12 දා,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය, කොළඹ 7.

3–372—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

1973 අංක 126

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

දෙහිවල, ආරෝග්‍ය ශාලා පාරේ, ජාතික නිවාස බී 2-2 පදිංචි රේජිස් සුන්දරම් ජෝශේන්ද්‍ර මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973ක් වූ පෙබරවාරි මස 8 දින,
කොළඹ දී ය.

3-260—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 127

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

වේයන්ගොඩ පදිංචි හැන්රි ජෝන් හදිසුල්ලා පොල මහතා වේයන්ගොඩ ප්‍රධාන කාර්යාලයද ඇතුව ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

3-291—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 128

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

බටපත් මාදෙල්ගමුවේ පදිංචි සුබසිංහ ආරච්චිගේ කමලා ගේට්වුඩ් පෙරේරා විජයවර්ධන ජයතිලක මහත්මිය මාකෙවිට කාර්යාලයද ඇතුව ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

3-292—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 129

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

ඇල්පිටියේ පදිංචි කලුහත්තිරි පටබැඳි ආරියදාස ශ්‍රී විජයානන්ද මහතා ඇල්පිටියේ කාර්යාලය ද පිටිගල අතුරු කාර්යාලය ද ඇතුව බලපිටිය අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973ක් වූ පෙබරවාරි මස 19 දින,
කොළඹ දී ය.

3-288—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 130

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

කඹුරුගමුවේ "සිරිනිවස" හි පදිංචි මද්දුම වෙල්ලාලගේ දයාවතී මහත්මිය මාතර කාර්යාලයද ඇතුව මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

3-294—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 131

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

මාතර හිත්තටිය නැගෙනහිර පදිංචි දයාවති සමරතුංග මහත්මිය දික්වැල්ලේ ප්‍රධාන කාර්යාලයද මාතර අතුරු කාර්යාලයද ඇතුව මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

3-293—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 132

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

මාතර කොටුවේගොඩ පදිංචි විලියම් සමරවීර මහතා කොටුවේගොඩ ප්‍රධාන කාර්යාලයද අකුරැස්සේ අතුරු කාර්යාලයද ඇතුව මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

3-290—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 133

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

මාතර හිත්තටියේ පදිංචි අමරා සපුකොටන මහත්මිය මාතර ප්‍රධාන කාර්යාලයද දික්වැල්ලේ අතුරු කාර්යාලයද ඇතුව මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේව කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

3-289—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

1973 අංක 134

නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කුරුණෑගල පදිංචි ඇලෙක්සැන්ඩර් පින්තුගේ ඒරන් ඇලෙක්සැන්ඩර් මහතා කුරුණෑගල කාර්යාලය ද ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973ක් වූ පෙබරවාරි මස 19 දින,
කොළඹ දී ය.

3–296—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

1973 අංක 135

නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

විහාරේගම නාරම්මල පදිංචි ජයකොඩි ආරච්චිගේ ජයකොඩි මහතා නාරම්මල කාර්යාලය ද වදුකඩ අතුරු කාර්යාලය ද ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973ක් වූ පෙබරවාරි මස 19 දින,
කොළඹ දී ය.

3–295—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නිවේදන

අංකය : සී. 353/ආර්ජීසී.

**නෞකා අධිකාරියට පත් කිරීම—ශ්‍රී ලංකා නාවික හමුදාව**

චීන මහජන සමූහාණ්ඩුවෙන් ලැබුණු වේගවත් මුර යාත්‍රාව 1973 ජනවාරි 1 වන දින සිට ශ්‍රී ලං. නා. නෞ. "බලවතා" යනුවෙන් අධිකාරයට පත් කිරීම අනුමත කිරීමට ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් ප්‍රසාදය පළ කොට ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි 27 වැනි දින,
කොළඹ දී ය.

3–444/1—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

රා. ආ. වි./ලේ.—ඊ/පී 20/230 (72)

**අපරාධ නඩු විධාන සංග්‍රහය—2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාවේ පිහිටුවන ලද පොලිස් මුරපොල, පොලිස් ස්ථානයක් බවට, (20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 21 දින,
කොළඹ දී ය.

3–305—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත**

16 ඇ වැනි වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16 ඇ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ජනරජයේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍ය යැයි කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා විසින් සලකනු ලබන ව්‍යාපාරයන් වන මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් නව කාර්මික ව්‍යාපාර, ඉහත කී වගන්තියේ කාර්යයන් සඳහා අනුමත ව්‍යාපාර වශයෙන්, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි මෙයින් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍යවරයා.

1973 පෙබරවාරි 23 දින,
කොළඹ දීය.

**උපලේඛනය**

| කාර්මික යෝජනා ක්‍රමය පිළිබඳ විස්තර | නව කාර්මික ව්‍යාපාරයේ නම |
| --- | --- |
| 1. ශීතකළ මුහුදු ද්‍රව්‍ය අපනයන කරුවෝ | සීමාසහිත පෙරි ජේම්ස් එන්ටර් ප්‍රයිසස්. |
| 2. ශීතකළ හා පදම් කළ මුහුදු ද්‍රව්‍ය අපනයනකරුවෝ | සීමාසහිත ස්ටර්ලින් මැරයින් ප්‍රඩක්ස්. |

3–253/1—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත**

69 වගන්තිය යටතේ දැන්වීම

1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 69 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, නානායක්කාර පතිරගේ මාටින් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ජනරජයේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍ය යැයි කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා විසින් සලකනු ලබන යෝජනා ක්‍රමයක් වූ, මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිත නව කාර්මික ව්‍යාපාරය, ඉහත කී වගන්තියේ කාර්යයන් සඳහා අනුමත යෝජනා ක්‍රම වශයෙන්, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍යවරයා.

1973 පෙබරවාරි 23 දින,
කොළඹ දීය.

**උපලේඛනය**

| නව ව්‍යාපාරයේ නම | නිෂ්පාදිතය පිළිබඳ විස්තරය |
| --- | --- |
| 1. සීමාසහිත සිග්මා (ඉංජිනේරුවෝ සහ නිෂ්පාදකයෝ) | තෙරපීමේ උපකරණ, අච්චු, අමතර කොටස් සහ අංගෝපාංග සහ සරල යන්ත්‍ර නිෂ්පාදනය. |

3–253/2—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

### 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 10 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, නානායක්කාර පතිරගේ මාටින් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ජනරජයේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යැයි කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර අමාත්‍යවරයා විසින් සලකනු ලබන යෝජනා ක්‍රමයන් වූ, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිත නව කාර්මික ව්‍යාපාර ඉහත කී 10 වැනි වගන්තියේ (5) වැනි උපවගන්තියේ කාර්යයන් සඳහා අනුමත කළ යෝජනා ක්‍රම වශයෙන්, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි මෙසින් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1973 පෙබරවාරි 23 වැනි දින,
කොළඹ දීය.

උපලේඛනය

| නව කාර්මික ව්‍යාපාරයේ නම | කාර්මික නිෂ්පාදනය පිළිබඳ විස්තරය |
|---|---|
| 1. සෙන්ට් ඇන්තනීස් ඉලෙක් ට්‍රොනික් කර්මාන්ත | ගුවන් විදුලි යන්ත්‍ර සහ ගුවන් විදුලි යන්ත්‍ර අංගෝපාංග එකලස් කිරීම, නිෂ්පාදනය කිරීම. |
| 2. සීමාසහිත සිග්මා (ඉංජිනේරුවෝ සහ නිෂ්පාදකයෝ) | තෙරපීමේ උපකරණ, අච්චු, අමතර කොටස් සහ අංගෝපාංග සහ සරල යන්ත්‍ර නිෂ්පාදනය. |
| 3. සීමාසහිත පෙරිජේම්ස් එන්ටර් ප්‍රයිසස් | ශීත කළ හා සකස් කළ මුහුදු ද්‍රව්‍ය අපනයනකරුවෝ. |
| 4. සීමාසහිත ස්ටර්ලින් මැරයින් fපුඩ්ස් | ශීත කළ හා සකස් කළ මුහුදු ද්‍රව්‍ය අපනයනකරුවෝ. |
| 5. ෂම්ස් ප්‍රඩක්ට්ස් | රබර්වල ගිල්වන ලද භාණ්ඩ, බෝතල් සූප්පු, වැල්ව් සහ සූප්පු ආදිය. |

3–253/3—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### පඩිපාලක සභා ආඥාපනත

#### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 20(2) (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව කම්කරු ඇමති මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, පොල් කම්හන්තයේ නියුක්ත කම්කරුවන්ට අදාළ මාසික ජීවන වියදම් අංකය නිශ්චය කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂවරයා නිසි නිලධාරියා වශයෙන් 1953 ජූනි මස 25 වැනි දින අංක 10,541 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද පත් කිරීම මෙසින් අවලංගු කරමි.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දීය.

3–263—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 29/51. අංකය : ඩී. 20/එප්ආර් සහ එම්ටී.

### වෙඩිපිටි හා යුද්ධ අභ්‍යාස පනත

(363 වැනි අධිකාරය වන) වෙඩිපිටි සහ යුද්ධ අභ්‍යාස පනතේ 2 වැනි වගන්තිය යටතෙහි රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් කරන ලද නියමය.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍ය.

1973 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

#### නියමය

මෙහි උපලේඛනයේ I වැනි තීරයෙහි විස්තර කෙරෙන වෙඩිපිටි මින් ස්ථාපනය කෙරෙන අතර, ඒවායේ සීමා එකී විස්තර ඉදිරියෙහි දෙවැනි තීරයෙහි නියමිත පරිදි වේ.

#### උපලේඛනය

| I | II |
|---|---|
| කුඩා අවි වෙඩිපිටිය ශ්‍රී.ලං.නා. එළාර කාරෙයිනගර් | කාරෙයිනගර් හි ශ්‍රී.ලං.නා.නෞ එළාර නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදා කඳවුරේ ප්‍රධාන කුඹගස මධ්‍යයේ සිට අඩි 46 ක් ඈතින්, තංඩලේ ගබඩාව වටා ඇති සිමෙන්ති තාප්පයේ දකුණු කෙලවරේ සිට 0.51° වන දත්ත ලක්ෂ්‍යයේ සිට අඳිනු ලබන සාමාන්තර රේඛාවලින් සීමාවෙන කොටස :— |
| | දකුණට : කාරෙයිනගර් හි දිය ඇලේ ඉවුරේ ඉහත සඳහන් දත්ත ලක්ෂ්‍යයේ සිට අංශක 235 ක් වන සේ ඇඳි රේඛාවක් ; |
| | නැගෙනහිරට : දත්ත ලක්ෂ්‍යයේ සිට අංශක 325 වන සේ අඩි 80 ක් දුර දක්වා ඇති රේඛාවක් ; |
| | උතුරට : දකුණු මායිමේ සිට අඩි 80 ක් ඈතින් වන සේ බටහිරට සමාන්තරව, කාරෙයිනගර් හි දිය ඇලේ ඉවුර දක්වා ඇඳි රේඛාවක් ; |
| | බටහිරට : කාරෙයිනගර් හි දිය ඇල. |

3–238/1—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 29/51. අංකය : ඩී. 20/එප්ආර් සහ එම්ටී.

### වෙඩිපිටි හා යුද්ධ අභ්‍යාස පනත

#### නියමය

(363 වැනි අධිකාරය වන) වෙඩිපිටි හා යුද්ධ අභ්‍යාස පනතේ 3(1) වැනි වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම මෙම නියමයෙන්—

(අ) මෙහි උපලේඛනයේ I වැනි තීරුවෙහි සඳහන් වෙඩිපිටිය එම සටහන ඉදිරියෙහි II වැනි තීරුවෙහි නියමිත වෙඩි අභ්‍යාස සඳහා පාවිච්චි කළ යුතු බවද ;

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවට, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ඉහත කී වෙඩිපිටිය පාවිච්චි කළ හැකි බවද

නියම කරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍ය.

1973 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

| I | II |
|---|---|
| කාරෙයිනගර්හි ශ්‍රී.ලං.නා. ‘එළාර’ නෞකාවේ කුඩා අවි වෙඩිපිටිය | .22 රයිපල්, රිවෝල්වර සහ මැෂින් කාබයින් වෙඩි තැබීම සඳහා. |

3–238/2—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

එල්. ඩී.—බී. 29/51. අංකය : ඩී. 20/එෆ්ආර් සහ එම්පී.

**වෙඩිපිටි හා යුද්ධ අභ්‍යාස පනත (363 අධිකාරය)**

(363 වැනි අධිකාරය වන) වෙඩිපිටි සහ යුද්ධ අභ්‍යාස පනතේ 17 වැනි වගන්තිය යටතෙහි රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍ය.

1973 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 1973 වෙඩිපිටි නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කාරෙයිනගර්හි, ශ්‍රී.ලං.නා. එළාර නෞකාවේ කුඩා අවි වෙඩිපිටිය (මෙහි මින් මතුවට ශ්‍රී.ලං.නා. එළාර නෞකාවේ කුඩා අවි වෙඩිපිටිය යනුවෙන් හැඳින්වෙන) .22 රයිපල්, රිවෝල්වර සහ මැෂින් කාබයින් වෙඩි තැබීම සඳහා හැර වෙනත් වෙඩි තැබීම් සඳහා පාවිච්චි නොකළ යුතුය.

3. නාවික හමුදාපති හෝ ඔහු විසින් අවසරය දෙනු ලැබූ යම් පුද්ගලයකු විසින්, ශ්‍රී.ලං.නා. එළාර නෞකාවේ කුඩා අවි වෙඩිපිටියෙහි වෙඩි තැබීමෙහි නිරත පුද්ගලයින්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය පරිදි නියමයන් කළ හැකිය.

3–338/2—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත**

5 වැනි වගන්තිය යටතේ නිවේදනය

(110 වන අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය, ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1972 දෙසැම්බර් මස 08 වැනි දින අංක 37 දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නිවේදනයේ "ආ" උපලේඛනයේ 7 ආ විෂය, "අලවතුගොඩ" යන වචනය වෙනුවට "බෝගහකුඹුර නොහොත් අලවතුගොඩ" යන වචනය යෙදීමෙන්, 1973.03.15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

1973 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

3–402—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරණ කෘෂිකාර්මික පලදා වර්ධන පනත**

1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනතේ 23(1) වගන්තිය යටතේ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු බල ප්‍රදේශයක් නිශ්චය කිරීම

1972 අංක 2 දරණ කෘෂිකාර්මික පලදා වර්ධන පනතේ 23(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෘෂිකර්ම හා ඉඩම් ඇමති හෙක්ටර් සෙනරත් රාජකරුණා බණ්ඩා කොබ්බෑකඩුව වන මම, 1972 අංක 2 දරණ කෘෂිකාර්මික පලදා වර්ධන පනත යටතේ පිහිටුවන ලද කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු වල බල ප්‍රදේශයන් මේ සමග ඇති උපලේඛනයේ විස්තර වන අන්දමට විය යුතුයයි නිශ්චය කරමි.

එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

1973 මාර්තු මස 1 දින,
කොළඹ දී.

උපලේඛනය

| කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ නම | | බලප්‍රදේශය |
|---|---|---|
| 1. ගිරාගම | ... | යටිනුවර මැදපලාත ගම්සභා ප්‍රදේශය. |
| 2. දැලිවල | ... | පදවිගම්පල ගම්සභා ප්‍රදේශය හා රඹුක්කන සුළුනගර සභා ප්‍රදේශය. |
| 3. අළුගොල්ල | ... | වගපනහ උඩසියපත්තු ගම්සභා ප්‍රදේශය. |

3–502—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**සමගි මණ්ඩල පනත**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, 1971 ජනවාරි මස 15 වැනි දින අංක 14,941 දරන ගැසට් නිවේදනයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කටාන ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සභාපතිව සිට එම ධුරයෙන් ඉල්ලා අස්වූ කටාන, කඳවල පදිංචි දොස්තර එච්. ඉසැඩ්. ජී. ඔස්වල්ඩ් සේනානායක මහතා වෙනුවට කටාන, ඇත්ගාල පදිංචි බී. ජෙරමියස් ප්‍රනාන්දු පුල්ලේ මහතා එකී සභාවේ සාමාජික ධුරය දරන කාලය තුළදී එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

3–427—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**සමගි මණ්ඩල පනත**

ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 ඔක්තෝබර් මස 2 වැනි දින අංක 14,926 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 8 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි එල්ලාවල ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන මෙයින් පත් කරමි :—

(1) ඇහැලියගොඩ, දියෝගෙදර පදිංචි මුදියන්සේලාගේ ඩිංගිරි මුදියන්සේ මෛත්‍රීරත්න මහතා.

(2) එල්ලාවල, පහළගම පදිංචි යද්දෙහි රාළලාගේ පියසේන මහතා.

(3) එල්ලාවල, පහළගම පදිංචි වලමුණි දේවගේ ජේම්ස් ජයරත්න මහතා.

(4) පරකඩුව, බෝධිමලුව පදිංචි බෝධිමලුව ගමගේ ඉහළ මත්තේ ගුණතුංග මහතා.

(5) ඇහැලියගොඩ, පුවක්ගහදෙනිය පදිංචි විතානපතිරන්නැහැලාගේ බෙඩින් පතිරණ මහතා.

(6) ඇහැලියගොඩ, තලාවිටිය පදිංචි අලවත්තගේ දොන් පත්මසිරි මහතා.

(7) පරකඩුව, බෝධිමලුව පදිංචි දැරණියගලගේ ජිනදාස මහතා.

(8) පරකඩුව, බෝධිමලුව පදිංචි බෝධිමලුව ගමගේ අභය වර්ධන මහතා.

(9) පරකඩුව, තලාවිටිය පදිංචි නාගොඩ මනන්නලාගේ සිරිදරා නොහොත් සේදිරිස් අබේරත්න මහතා.

(10) පරකඩුව, බෝධිමලුව පදිංචි බෝධිමලුව ගමගේ ප්‍රේම රත්න මහතා.

(11) පරකඩුව, තලාවිටිය පදිංචි උඩහ පොලේගේ කරුණා රත්න මහතා.

(12) පරකඩුව, තලාපිටිය පදිංචි බදුවල හේවාසින්ගේ සරනේලිස් මහතා.

(13) පරකඩුව, තලාවිටිය පදිංචි මනන්නලාගේ මැණිකා මහතා.

(14) පරකඩුව, පුස්සැල්ල පදිංචි බටහැටයලාගේ සසිමත් මහතා.

(15) පරකඩුව, පොහොරඹාව පදිංචි මියනදෙනිය ගමරාළලාගේ සිරිවර්ධනහාමි මහතා.

(16) පරකඩුව, පුස්සැල්ල පදිංචි දොන් රොබට් දෙල්පේ මහතා.

(17) පරකඩුව, පුස්සැල්ල, චෛතියගිරි පිරිවෙනෙහි පූජ්‍ය රත්නපුරේ මංගල ස්වාමින්වහන්සේ.

(18) එල්ලාවල, අකුගම පදිංචි ඉහළගමරාළලාගේ අප්පු සිංඤෝ මහතා.

(19) කිරිඇල්ල, බ/මුදුන්කොටුව පදිංචි දඹුලුවන අතුකෝරාළලාගේ විජේරත්න මහතා.

(20) කිරිඇල්ල, මාටුවාගල පදිංචි හෙට්ටි පතිරණ කංකානම ලාගේ ගුණපාල මහතා.

(21) කුරුවිට, මිල්ලවිටිය පදිංචි මිල්ලවිටිය ගමඇතිරාළලාගේ රත්නසේකර මහතා.

(22) එල්ලාවල, දෙහෙරගොඩ පදිංචි හපුරුගල ගම්ලද්දලාගේ හීන්මහත්මයා මහතා.

(23) එල්ලාවල, පරණගම පදිංචි පාදුක්කේ දොන් ඇඩ්මන් පෙරේරා මහතා.

(24) එල්ලාවල, කනුග්ගල්ල පදිංචි රන්හොටිගේ කරුණා රත්න මහතා.

(25) එල්ලාවල, පරණගම පදිංචි හපුරුගල ගම්ලද්දලාගේ ඒමිස් සිංඤෝ මහතා.

(26) එල්ලාවල, පරණගම පදිංචි විතාරමලාගේ සුසිල් පේම සිංහ මහතා.

(27) එල්ලවාල, පදිංචි මාතර කංකානමලාගේ පොඩිමහත් මයා මහතා.

(28) එල්ලාවල, 'පියසෙවන' හි පදිංචි නෙපුලංගොඩ මුදියන්සේලාගේ පොඩි අප්පුහාමි මහතා.

(29) එල්ලාවල පදිංචි ජනත් කංකානමලාගේ වීරවර්ධන මහතා.

(30) එල්ලාවල, පහළගම, පදිංචි කේ. ඩබ්ලිව්. බබාසිංඤෝ මහතා.

(ආ) ඇහැලියගොඩ, දියෝගෙදර පදිංචි මුදියන්සේලාගේ ඩිංගිරි මුදියන්සේ මෛත්‍රීරත්න මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

3-430/1—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

සමගි මණ්ඩල පනත

ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1972 සැප්තැම්බර් මස 8 වැනි දින අංක 24 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 1 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ හම්බන්තොට දිස්ත්‍රික්කය තුල පිහිටි වලස්මුල්ල සුළු නගර සභා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) වලස්මුල්ල, බෙලිඅත්තපාර, දිස්පැන්සරියෙහි දොස්තර රනපාල පින්නදූව මහතා.

(2) වලස්මුල්ල, අසෝකාරාමවාසී පූජ්‍ය වලස්මුල්ලේ නන්ද ස්වාමින්වහන්සේ.

(3) වලස්මුල්ල, මහ වීදිය පදිංචි වීරසූරිය මහවිදානගේ ගුණපාල මහතා.

(4) වලස්මුල්ල, මහ වීදිය පදිංචි රපියෙල් ලියනගේ මහතා.

(5) වලස්මුල්ල, වීරරත්න ස්ටෝර්ස් හි පීටර් වීරරත්න මහතා.

(6) වලස්මුල්ල, පැවිරල් ගබඩාවෙහි කේ. එච්. චන්ද්‍රපාල මහතා.

(7) වලස්මුල්ල, මිද්දෙනිය පාර, අංක 94 හි පදිචි ජී. ඇම්. පේමාවතී මහත්මිය.

(8) වලස්මුල්ල, මාර්කට්හි සරංගුහේවාගේ මැන්ඩිස් සිල්වා මහතා.

(9) වලස්මුල්ල, මාර්කට් හි බෙනට්ක් සමරජීව මහතා.

(10) වලස්මුල්ල මාර්කට් හි බෙනට්ක් සමරජීව මහතා.

(11) වලස්මුල්ල, බෙලිඅත්ත පාර පදිංචි ලමාහේවාගේ හෙන්ද්‍රික් සිංඤෝ මහතා.

(12) වලස්මුල්ල, බෙලිඅත්ත පාර පදිංචි කේ. ඒ. වික්ටර් ද සිල්වා මහතා.

(13) වලස්මුල්ල, වීරකැටිය පාර පදිංචි බී. එස්. අබේසිර මහතා.

(14) වලස්මුල්ල, වීරකැටිය පාර පදිංචි ඇම්. එච්. චාර්ලිස් සිංඤෝ මහතා.

(15) වලස්මුල්ල, පල්ලෙකන්ද පාර පදිංචි සිරිසේන දේව සිංහ මහතා.

(16) වලස්මුල්ල, වීරකැටිය පාර පදිංචි සිල්වියා විරිත්ත මුල්ල මහත්මිය.

(17) වලස්මුල්ල, මාර්කට් හි පී. ඇම්. අප්පුසිංඤෝ මහතා.

(18) වලස්මුල්ල, මිද්දෙනිය පාර පදිංචි කේ. ඒ. සුගතදාස මහතා.

(19) වලස්මුල්ල, දයාරත්න පාර පදිංචි වෙල්ලප්පිලි ආරච්චිගේ නිකුලස් මහතා.

(20) වලස්මුල්ල, මිද්දෙනිය පාර පදිංචි අහම්මදු ස්මයිල් මහතා.

(21) වලස්මුල්ල, මුදුන පදිංචි එච්. පී. සිරිසේන මහතා.

(ආ) වලස්මුල්ල, බෙලිඅත්ත පාර, දිස්පැන්සරියෙහි දොස්තර රනපාල පින්නදූව මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

3–430/2—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියා විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 ඔක්තෝබර් මස 2 වැනි දින අංක 14,926 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 7 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි කිරින්ද-පුහුල්වැල්ල ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායක යින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) පුහුල්වැල්ල. කිරින්ද මගින් පහල පදිංචි විතාන පතිරණගේ පීටර් මහතා.

(2) පුහුල්වැල්ල, කිරින්ද මගින් ඉහල පදිචි ආරියපාල පිටදෙනිය ගමගේ මහතා.

(3) පුහුල්වැල්ල, කිරින්ද මගින් ඉහල, කෝංකැටිය පදිංචි බුද්ධදාස අබේවර්ධන වික්‍රමසිංහ මහතා.

(4) පුහුල්වැල්ල, කිරින්ද මගින් ඉහල පදිංචි සමරතුංග විදාන ආරච්චිගේ බේබිසිංඤෝ මහතා.

(5) පුහුල්වැල්ල, ඔවිටිගමුව, තේක්කවත්ත පදිංචි කෝදා වෙ පතිරණගේ ඇල්බට් මහතා.

(6) පුහුල්වැල්ල, ඔවිටිගමුව පදිංචි දොන් සාමෙල් රණතුංග මහතා.

(7) පුහුල්වැල්ල, වලකන්ද, පිංදෙනිය පදිංචි කංකානම් ගේ කරෝලිස් මහතා.

(8) පුහුල්වැල්ල, වලකන්ද, පිල්ලගේන පදිංචි පෝද්දුව කංකාම්ගේ සිරිසේන මහතා.

(9) පුහුල්වැල්ල, වතුකොලකන්ද, අරඹවත්තගේන පදිංචි හේවා කංකානම්ගේ ජුවානිස් අප්පු මහතා.

(10) පුහුල්වැල්ල, හෙට්ටියාවල, පුංචිමූකලාන පදිංචි හේවා තලගම්ගේ ගුණදාස මහතා.

(11) කුරපුටුගල, කනත්තෙගෙදර පදිංචි හක්මනදූර ලීල සේන මහතා.

(12) කරපුටුගල, බඹරපුස්වැල්ගේන පදිංචි රංගොඩගේ චන්ද්‍රපාල මහතා.

(13) පුහුල්වැල්ල පදිංචි පතිනාගොඩගේ ධනපාල මහතා.

(14) පුහුල්වැල්ල පදිංචි දොන් අන්ද්‍රයස් සමරනායක මහතා.

(15) පුහුල්වැල්ල පදිංචි සුසන්ත සේනාධිර මහතා.

(16) පුහුල්වැල්ල. 'නන්දන' හි පදිංචි දොන් කරෝලිස් රණතුංග මහතා.

(17) පුහුල්වැල්ල, කෝංකැටිගොඩ පදිංචි සියඹලාදූව පතිර ණගේ සාමෙල් මහතා.

(18) පුහුල්වැල්ල, හෙට්ටියාවල පදිංචි හේවාරුම්බිගේ ආරියදාස මහතා.

(19) පුහුල්වැල්ල, කිරින්ද මගින් පහල, කීර්තිරත්න ඖෂධාලයෙහි සිරිසේන දේවේන්ද්‍ර මහතා.

(20) කරපුටුගල, 'වික්‍රම නිවස' හි පදිංචි කුලරත්න වික්‍රමාදර මහතා.

(21) පුහුල්වැල්ල, හෙට්ටියාවල, බෙට්මේ වලව්ව පදිංචි ජෝන් අබේවර්ධන වික්‍රමසිංහ මහතා.

(22) පුහුල්වැල්ල, මාර/හෙට්ටියාවල ක. විදුහලෙහි රයිගම් කෝරලේ කොඩිතුවක්කු ආරච්චිගේ පියදාස මහතා.

(23) පුහුල්වැල්ල, කිරින්ද මගින් ඉහල පදිංචි හේවා රදාගේ හරමානිස් මහතා.

(24) පුහුල්වැල්ල, වලකන්ද, සපුවත්ත පදිංචි ඩයස් කොඩිතුවක්කු මහතා.

(ආ) පුහුල්වැල්ල, කිරින්ද මගින් පහල පදිංචි විතාන පතිරණ ගේ පීටර් මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

3–430/3—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

**සමගි මණ්ඩල පනත**

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, ඒ වගන්ති යටතේ කරනු ලැබ 1972 ජනවාරි 14 වැනි දින අංක 14,993 දරන ගැසට් පත්‍රයේ පළ කෙරුණු ආඥාවේ (අ) ඡේදය යටතේ සඳහන් වූ බදුල්ල දිස්ත්‍රික්කය තුල පිහිටි තැන්නෙකුඹුර ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ අංක 9 යටතේ හා 1972 අගෝස්තු මස 18 වැනි දින අංක 21 දරන ගැසට් පත්‍රයේ පළ කෙරුණු ආඥාවේ සඳහන් වූ "කැප්පෙටිපොල, අලවතු ගොඩ පදිංචි ගුණසේකර රාමනායක මහතා" යන වචන වෙනුවට "බෝගහකුඹුර, අලවතුගොඩ පදිංචි රාමනායක මුදියන්සේලාගේ ගුණසේකර මහතා" යන වචන ආදේශ කර මෙයින් සංශෝධනය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

3-429—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

අංක: සී/අයි. 1191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**
4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව, ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2 සහ සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ් ක්‍රාෆ්ට්, 111, මීගමු පාර, පැලියගොඩ. අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 6, කාලිංග පෙදෙසේ අංක 6 හී පදිංචි ඒ. එස්. කොහොඹන් වික්‍රම් මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද් ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 පෙබරවාරි මස 12 දින,
කොළඹ දී ය.

---

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2.

සහ

සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ් ක්‍රාපට්, 111, මීගමු පාර, පැලියගොඩ.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය සහ සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ්ක්‍රාපට් අතර පවතින කාර්මික ආරවුල වනුයේ,

(1) ජී. ඩබ්ලියු. ජී. විජේදාස, ඇස්. බෙනඩික්, ඇස්. ඇල්. චන්ද්‍රසිරි සහ ඒ. ඩබ්ලිව්. ඩී. ජෝතිපාල යන මහත්වරුන් සේවයෙන් පහකිරීම යුක්තිසහගතද යන්න හා ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න හා,

(2) ඩී. කේ. ප්‍රේමදාස, ආර්. ඒ. සිරිසේන, එච්. ඒ. නෝබට්, බී. නන්දසේන, කේ. ඩී. සී. අබේසිංහ, ඒ. ඇම්. නන්දසේන සහ ඩබ්ලිව්. ඩී. දයානන්ද යන මහත්වරුන් 1972. 09. 07 වෙනි දින සිට දින 7 ක් සේවයේ නොයෙදවීම සහ වේතන නොගෙවීම යුක්ති සහගතද යන්නත් පිළිබඳව වේ.

1973 පෙබරවාරි මස 06 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

3-228—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ගවයින් හංවඩු ගැසීම—ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගරය හා කඩවත් ප්‍රා. ස. දි. කොට්ඨාශය**

1958 අංක 29 දරණ සත්ව පණත යටතේ පණවන ලද 1962. 11. 29 වැනි දින ලංකාණ්ඩුවේ අංක 13,406 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ රෙගුලාසිවල II වැනි කොටසේ 12 (iii) වගන්තිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගරය හා කඩවත් ප්‍රා.ස. දි. කොට්ඨාශයේ 1973 වර්ෂයේ ගවයින් හංවඩු ගැසීමේ වැඩ පිළිවෙල මෙහි පහත පළ කරමි.

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිසාපති.

1973. 02. 20 වන දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේදිය.

| ග්‍රා.සේ. කොට්ඨාශ අංකය | ග්‍රා.සේ. කොට්ඨාශයේ නම | හංවඩු ගසන ස්ථානය | දිනය |
|---|---|---|---|
| 229ඒ | ... චීනවරාය ... | ... ග්‍රාම සේවක කාර්යාලය ... ... | ... 73.4.01 හා 73.4.8 |
| 229 | ... වෙල්ලමනල් ... | ... ග්‍රාමසේවක කාර්යාලය ... ... | ... 73. 4. 22 |
| | | ගම් සභා කාර්යාලය ... ... | ... 73. 4. 29 |
| 242 | ... සාම්පල්තිවු ... | සල්ලිහි නඩරාජා මහතාගේ නිවාස භූමි ... | ... 73. 4. 03 |
| | | මාංකනේහි අම්මන් කෝවිල් අසල ... | ... 73. 4. 04 |
| | | සෙම්පාඩුහි සුබ්‍රමණියම් මහතාගේ නිවාස භූමි ... | ... 73. 4. 05 |
| | | සෙම්පාඩුහි ආල්වාපිල්ලේ මහතාගේ නිවාස භූමි | ... 73. 4. 07 |
| | | සාම්පල්තිවු හි මහාලිංගම් මහතාගේ නිවාස භූමි | ... 73. 4. 10 |
| | | ආතිමෝඩ්ඩෙහි කාතිගේසු මහතාගේ නිවාස භූමි | ... 73. 4. 11 |
| | | ආතිමෝඩ්ඩේ මුතු කුමාරු මහතාගේ නිවාස භූමි | ... 73. 4. 12 |
| | | සෙම්පාඩුහි නඩරාජා මහතාගේ නිවාස භූමි ... | ... 73. 4. 06 |

| ග්‍රා. සේ. කොට්ඨාශ අංකය | ග්‍රා. සේ. කොට්ඨාශයේ නම | හංවඩු ගසන ස්ථානය | දිනය |
|---|---|---|---|
| 243 | උප්පුවෙලි | ගම්සභා කාර්යාලය | 73. 5. 08 |
| | | ගම්සභා කාර්යාලය (වෙල්වනායගපුරම් සඳහා) | 73. 5. 09 |
| | | කන්නියා ග්‍රා. සං. ස. භූමිය | 73.5. 11 හා 73. 5. 12 |
| | | තුවරන්කාඩු ග්‍රා. සං. ස. භූමිය | 73. 5. 23 |
| | | තුවරන්කාඩු ග්‍රා. සං. ස. භූමිය (අලස්වත්ත සඳහා) | 73. 5. 24 |
| | | කා. ග්‍රා. සං. ස. භූමිය (මිහිඳු පුර සඳහා) | 73. 6. 06 |
| | | ජේෂකර්ම මධ්‍යස්ථාන භූමි, අන්පුවෙලි පුරම් | 73.6.13 |
| | | උප්පුවෙලි පොලිස් මධ්‍යස්ථාන භූමි (අබේපුර සඳහා) | 73.6. 20 |
| | | පාලයුත්තු ක්‍රීඩා පිට්ටනිය | 73. 6. 27 |
| | | බන්ඩිපාර ආන්දාන්කුලම් | 73. 6. 28 |
| 244 | ත්‍රිකුණාමලය නගරය | ප්‍රා. ස. දි. කාර්යාල භූමිය | 73. 5. 05, 73. 6. 09 හා 73. 7. 21 |
| | | මුතු කුමාර කෝවිල් භූමිය | 73. 5. 12, 73. 6. 16 හා 73. 7. 28 |
| | | විශාල පිට්ටනිය | 73. 5. 19, 73. 6. 23 හා 73. 8. 04 |
| | | සිවන් කෝවිල් භූමිය | 73. 5. 26, 73. 6. 30 හා 73. 8. 18 |
| | | ලව්ලේන් භූමිය | 73. 06. 02, 73. 7. 07 හා 73. 8. 18 |

3–262—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**වවුනියා දිස්ත්‍රික්කයේ (වවුනියා උතුර) කොට්ඨාශයේ 1973 වර්ෂයට ගවයින් හණ නිවරණය කිරීමේ වැඩ පිළිවෙල**

1962 නොවැම්බර් 22 දින 13,496 (සිංහල භාෂාවෙන්) දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ගවයින් හණනිවරණය කිරීමේ නියෝග මාලාවේ 12 වැනි (iii) වගන්තිය අනුව 1973.4.1 දින සිට වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා උතුරු කොට්ඨාශයේ 1973 වර්ෂයට ගවයින් නිවරණය කිරීමේ වැඩ සටහන මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එල්. පී. වික්‍රමාරච්චි,
වවුනියා දිසාපති.

1973 පෙබරවාරි 21 දින,
දිසාපති කාර්යාලය, වවුනියාව.

| ග්‍රාමසේවක කොට්ඨාශය හා අංකය | නිවරණය කරන ස්ථානය | නිවරණය කරන දිනය |
|---|---|---|
| 221—උංජල්කට්ඩි | මරුතෝඩේ සමුපකාර වෙළඳ සැල පිහිටා ඇති ඉඩමේ | සෑම මසකම පළමුවන අඟහරුවාද |
| | උංජල්කට්ඩි ආර්. නට්කුනම්ගේ ගෙය ඉදිරිපිට | සෑම මසකම පළමුවන බදාදා |
| | කෝවිල් පුලියන්කුලම් පුල්ලෙයාර් කෝවිල ඉදිරිපිට | සෑම මසකම පළමුවන බ්‍රහස්පතින්දා |
| | වෙඩිවෙත්තකල්ලු රජයේ දෙමළ මිශ්‍ර පාසැල ඉදිරිපිට | සෑම මසකම හතරවන බ්‍රහස්පතින්දා |
| | තෝර්මොඩ්ඩේ රජයේ දෙමළ මිශ්‍ර පාසැල ඉදිරිපිට | සෑම මසකම පළමුවන සෙනසුරාදා |
| | නොච්චිකුලම් රජයේ දෙමළ මිශ්‍ර පාසැළ ඉදිරිපිට | සෑම මසකම දෙවන අඟහරුවාද |
| | පඩ්ඩායි මුරින්දකුලම්හි කේ. කාසිගේ ගෙය ඉදිරිපිට | සෑම මසකම දෙවන බදාදා |
| | කට්කුලම් රජයේ දෙමළ මිශ්‍ර පාසැල ඉදිරිපිට | සෑම මසකම දෙවන බ්‍රහස්පතින්දා |
| | පඩ්ඩිකුඩිඉරුප්පු ග්‍රාම සංවර්ධන සංගමය ඉදිරිපිට | සෑම මසකම තුන්වන බ්‍රහස්පතින්දා |
| | කාන්වෝර්මොඩෙහි මුත්තාගේ ගෙය ඉදිරිපිට | සෑම මසකම දෙවන සෙනසුරාදා |
| 222—නෙඩුන්කර්නි | පනෙයිනීන්රාන් අම්බාන් කෝවිල ලඟ | සෑම මසකම පළමුවන් හා හතරවන අඟහරුවාද |
| | මාරාඉලුප්පේ ග්‍රාම සංවර්ධන සමිති ශාලාව ඉදිරිපිට | සෑම මසකම පළමුවන හා හතරවන බදාදා |
| | කුලවිසුඩාන්වල කේ. කර්තිගේසුගේ ගෙය ඉදිරිපිට | සෑම මසකම පළමුවන හා හතරවන බ්‍රහස්පතින්දා |
| | වේලන්කුලම් ග්‍රාමසංවර්ධන සමිති බිමේ | සෑම මසකම පළමුවන හා හතරවන සෙනසුරාදා |
| | මාමඩුහි රත්නම්ගේ ගෙය ඉදිරිපිට | සෑම මසකම දෙවන හා තුන්වන බ්‍රහස්පතින්දා |
| | නෙඩුන්කර්නිහි, කේ. තමෝදරම්පිල්ලේගේ ගේ ඉදිරිපිට | සෑම මසකම දෙවන හා තුන්වන බදාදා |
| | නෙඩුන්කර්නිහි, එස්. සිදම්බරපිල්ලේගේ ගේ ඉදිරිපිට | සෑම මසකම දෙවන හා තුන්වන සෙනසුරාදා |
| | ඕලුමඩුවල, එස්. ත්‍යාගරාජාගේ ගෙය ඉදිරිපිට | සෑම මසකම දෙවන හා තුන්වන සෙනසුරාදා |
| 223—පරන්තන් | ග්‍රාමසේවක කාර්යාලය, පරන්තන් | සෑම මසකම පළමුවන හා හතරවන අඟහරුවාද |
| | මතියාමඩු රජයේ දෙමළ මිශ්‍ර පාසැල ඉදිරිපිට | සෑම මසකම පළමුවන හා හතරවන බදාදා |
| | සින්නපුවරසන්කුලම් ප්‍රජාමණ්ඩල බිමේ | සෑම මසකම පළමුවන බ්‍රහස්පතින්දා |
| | ආනන්දපුලියන්කුලමේ එස්. සෙල්වදෙරේගේ ගේ ඉදිරිපිට | සෑම මසකම හතරවන බ්‍රහස්පතින්දා |
| | තුවරතෝරිවල හිටපු ගම්මුලාදෑනියාගේ බිමේ | සෑම මසකම පළමුවන සෙනසුරාදා |
| | නයිනාමඩු ගම්කාර්ය සභාව ඉදිරිපිට | සෑම මසකම හතරවන සෙනසුරාදා |
| | අයිලඩි ග්‍රාමසංවර්ධන සමිතිය ලඟ | සෑම මසකම දෙවන හා තුන්වන අඟහරුවාද |
| | පෙරියමඩු රජයේ දෙමළ මිශ්‍ර පාසැල ඉදිරිපිට | සෑම මසකම දෙවන හා තුන්වන බ්‍රහස්පතින්දා |
| | සන්නඩප්පන් ග්‍රාම සංවර්ධන ශාලාව ඉදිරිපිට | සෑම මසකම දෙවන හා තුන්වන බදාදා |
| | කරුප්පුකුන්ති රජයේ දෙමළ මිශ්‍ර පාසැල ඉදිරිපිට | සෑම මසකම දෙවන හා තුන්වන සෙනසුරාදා |
| 224—පුලියන්කුලම් | පුතූර් ග්‍රාම සංවර්ධන ගොඩනැගිල්ල ඉදිරිපිට | සෑම මසකම පලවන හා දෙවන සෙනසුරාදා |
| | සමලංකුලම්හි සෙල්ලතම්බුගේ ඉඩම ලඟ | සෑම මසකම පලවන හා දෙවන බ්‍රහස්පතින්දා |
| | කුරිසුඩ්ඩකුලම් ර.වැ.දෙ. ලිඳ ළඟ | සෑම මසකම තුන්වන බදාදා |
| | කුරිසුඩ්ඩකුලම් අම්මන් කෝවිල ළඟ | සෑම මසකම දෙවන බ්‍රහස්පතින්දා |
| | පුලියන්කුලම්හි මුත්තාර් නඩරාජාගේ ඉඩමේ | සෑම මසකම හතරවන බදාදා |
| 225—කනගරායන්කුලම් | කනගරායන්කුලම් වී. රාසයියාගේ ගේ ලඟ | සෑම මසකම පළමුවන අඟහරුවාද |
| | කනගරායන්කුලම් කේ. අරුඟම්පලම්ගේ ගේ ලඟ | සෑම මසකම දෙවන අඟහරුවාද |
| | පෙරියකුලම්හි පී. සින්නකුඩ්ඩිගේ ගෙය ලඟ | සෑම මසකම තුන්වන අඟහරුවාද |
| | කොල්ලපුලියන්කුලම්හි ඇම්. පී. සුබ්‍රමනියම්ගේ ගොවිපල ඉදිරිපිට | සෑම මසකම හතරවන අඟහරුවාද |
| | පන්කුලම්හි ඇම්. කන්දයියාගේ ගොවිපල ඉදිරිපිට | සෑම මසකම දෙවන සෙනසුරාදා |
| | මන්කුලම්හි පී. වෙල්ලයියාගේ ගේ ඉදිරිපිට | සෑම මසකම තුන්වන සෙනසුරාදා |
| | පුදුබුලාන්කුලම් කේ. සබාරත්නම්ගේ ගේ ඉදිරිපිට | සෑම මසකම හතරවන සෙනසුරාදා |

| ග්‍රාමසේවක කොට්ඨාශය හා අංකය | නිවරණය කරන ස්ථානය | නිවරණය කරන දිනය |
|---|---|---|
| 225ඒ—මාන්කුලම් ... | මාන්කුලම් ග්‍රාමසංවර්ධන සමිති බිමේ ... | ... සැම මසකම පලමුවන හා දෙවන අඟහරුවාද |
| | පනික්කකුලම් පුල්ලෙයාර් කෝවිල ලඟ ... | ... සැම මසකම පලමුවන බදද |
| | මුරුගන්ඩි පොදු වෙළඳසැල බිමේ ... | ... සැම මසකම පලමුවන හා දෙවන සෙනසුරාද |
| 226—ඔලුමඩු | ඔලුමඩු ගම්සභා කාර්යාලය ලඟ ... | ... සැම මසකම පලමුවන හා දෙවන අඟහරුවාද |
| | පුලුමච්චනාදිකුලම් කන්දසාමි කෝවිල ලඟ ... | ... සැම මසකම පලමුවන බදද |
| | අම්බහාමම් කොළණියේ ... ... | ... සැම මසකම පලමුවන බ්‍රහස්පතින්ද |
| 227—මනවාලන් පඩ්ඩමුරිප්පු | මනවාලන්පඩ්ඩමුරිප්පුහි කනක්ලර් ශාලාව අසල | ... සැම මසකම දෙවන හා තුන්වන බ්‍රහස්පතින්ද |
| | කරුඩ්ඩමුරිප්පු ග්‍රාමසංවර්ධන බිමේ ... | ... සැම මසකම දෙවන හා තුන්වන බදද |
| | පෙරියපුලියන්කුලම් අම්බන්කෝවිල අසල ... | ... සැම මාසයකම දෙවන හා හතරවන අඟහරුවාද |
| | කට්කිඩංගු අම්බන්කෝවිල අසල ... | ... සැම මසකම පලමුවන හා දෙවන සෙනසුරාද |
| | මාරායිතුන්නි පුල්ලෙයාර් කෝවිල අසල ... | ... සැම මසකම පලමුවන හා දෙවන ඉරිද |
| 228—තන්ඩුවාන් ... | ඔදියමලේ ගම්සභා ලිඳ ලඟ ... | ... සැම මසකම පලමුවන හා හතරවන අඟහරුවාද |
| | පෙරියපුලියන්කුලම්හි පලම්තල් වූ නමැති රජයේ ඉඩමේ | ... සැම මසකම පලමුවන හා හතරවන බ්‍රහස්පතින්ද |
| | තන්ඩුවාන් පිල්ලෙයාර් කෝවිල ලඟ ... | ... සැම මසකම පලමුවන හා හතරවන සෙනසුරාද |
| | පන්ඩාර්කුලම්හි පල්ලියට අයිති බිමේ ... | ... සැම මසකම දෙවන අඟහරුවාද |
| | පෙරියඉත්තිමඩු ග්‍රාමසංවර්ධන සමිති බිමේ ... | ... සැම මසකම තුන්වන අඟහරුවාද |
| 228—තන්ඩුවාන් ... | සින්නඉත්තිමඩු පුල්ලෙයාර් කෝවිල අසල ... | ... සැම මසකම දෙවන සෙනසුරාද |
| | අමුතන්කුලම්හි කුලකඩ්ඩු නමැති ඉඩමේ ... | ... සැම මසකම දෙවන හා තුන්වන බදද |
| | කුන්චුකෝඩාලිකල්ලුහි එස්. ආරුමුගම්ගේ ඉඩමේ | ... සැම මාසයකම හතරවන සෙනසුරාද |
| | කෝඩාලිකල්ලු පිලයකුඩි ඉරුප්පුහිදී ... | ... සැම මසකම දෙවන බ්‍රහස්පතින්ද |
| | පෙරිය ඉත්ති මඩුහි ග්‍රාම සංවර්ධන සමිති ශාලා බිමේ | ... සැම මසකම පලමුවන හා දෙවන අඟහරුවාද |

3–244—73.03.09 වැනි දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

ණය අංක 2961

**ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව**

**(402 අධිකාරය වන) කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥපනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව**

1973 ජනවාරි 26 වෙනි දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

"ප්‍රසිද්ධ නොතාරිස්, ඒ. ඇෆ්. බී. ඩී. ඩබ්ලිව්. තිලකරත්න විසින් ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව නමට ලියා සහතික කරන ලද අංක 1056 හා 65 මාර්තු 17 දින දරන බැඳුම්කරයෙහි සඳහන් ලෙවීම් 1938 අංක 51 දරන සමාගම් ආඥපනත යටතේ ස්ථාපිත පෞද්ගලික සමාගමක් වන කොළඹ බගතලේ පාරේ 23 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සීමාසහිත ඇඹුල්දෙනිය වතු සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූනවදහස් නවසිය අසූඅටයි සත විසිහතක (රු. 99,988.27) මුදලක් එකී සංස්ථාවට දැනට අයවිය යුතු හෙයින් ද, එකී අංක 1056 දරන බැඳුම්කරය මගින් එකී සංස්ථාවට උකස් කර ඇත්තා වූ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ උඩ පත්තුවේ ඇඹුල්දෙනියේ පිහිටි (කැබලි 1-51 සමන්විත), බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් සකස් කරන ලද අංක 192 හා 47.10.30 දින දරන ප්ලෑන ප්‍රකාර අක්කර 313, රූඩ් 3, පර්චස් 38 ක ප්‍රමාණයෙන් යුත් ඇඹුල්දෙනිය වත්ත නමැති ඉඩම එහි තුළ පිහිටි බංගලා, ගොඩනැගිලි සහ අනිකුත් සියළු දේ සමග රත්නපුරේ පදිංචි බලයලත් වෙන්දේසිකාර ඒ. එල්. ඒ. සම්මි මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමටත්; එසේ විකුණා එකී මුදල් හෝ එසේ විකුණන අවස්ථාවේදී එයින් ආපසු නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් සහ එවකට අයවිය යුතුව ඇති පොළියත්, එකී ආඥපනතේ 78 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රචාරක, විකුණුම් හා වෙනත් ගාස්තුද සමග අයකර ගැනීමටත් කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි".

1973 පෙබරවාරි 21 වැනි දින,
කොළඹ 3.

එච්. ඇස්. ඇෆ්. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

3–422—73.03.09 වැනි දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

අංක 434

**1970 අංක 35 දරන සමූපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත**

2 (1) වැනි වගන්තිය යටතේ ආඥාව

1970 අංක 35 දරණ සමූපකාර සමිති (විශෙෂ විධිවිධාන) පනතේ 2 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් රාජගල්ගොඩ ගමගේ සෝෂක ඔිල්කට් ගුණසේකර වන මම මෙහි වූ පළමුවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ("ඒකාබද්ධ වන සමිති" යනුවෙන් හැඳින්වෙන) සමිතිය මෙහිවූ දෙවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ("ප්‍රධාන සමිතිය" යනුවෙන් හැඳින්වෙන) සමිතිය සමග 1973 මාර්තු 11 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ මෙම ආඥාවෙන් ඒකාබද්ධ කරමි.

ආර්. ජී. ජී. ඔ. ගුණසේකර,
සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර
සමිති රෙජිස්ට්‍රාර්.

1973 මාර්තු මස 1 වැනි දින, කොළඹ,
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

පළමුවෙනි උපලේඛනය

ඒකාබද්ධ වන සමිතිය

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කල දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත කටුකුලම්පත්තු නැගෙනහිර විවිධ සේවා සමූපකාර සමිතිය ... ... | ත්‍රි. 305 ... | 1971.03.06 |

දෙවෙනි උපලේඛනය

ප්‍රධාන සමිතිය

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කල දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත නිලාවෙලි විවිධසේවා සමූපකාර සමිතිය ... ... ... | ත්‍රි. 303 ... | 1971.03.06 |

3–484—73.03.09 වැනි දින අංක 50 දරණ ගැසට් පත්‍රය

### පිස්සු බල්ලු උවදුර

බදුල්ල දිස්ත්‍රික්කයේ දැනට බල්ලන්ගෙන් අන්තරා සිදුවන බැවින් බල්ලන් සම්බන්ධ ආඥාපනතේ අංක 476 දරණ පරිච්ඡේදයේ අංක 11 දරණ වගන්තිය යටතේ 1973 මාර්තු මස 1 ද සිට මාස හයකට එම පළාත, බදුල්ල මහ නගර සභාව, බණ්ඩාරවෙල සහ හපුතලේ නගර සභා සහ ලුනුගල, පස්සර, වැලිමඩ හා හාලිඇල සුළු නගර සභාවලට අයත් ප්‍රදේශ හැර පිස්සු බල්ලු රෝගයට යටත් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරන බව මෙයින් දැනුම් දෙමි.

2. එබැවින් බදුල්ල දිස්ත්‍රික්කයේ ඉහත ප්‍රකාශයට යටත් ප්‍රදේශය තුළ, නොබඳින ලද හෝ අල්ලා නොගෙන යන බල්ලෙක්, යම් කෙනෙකුගේ ගෙදරක හෝ වත්තක හැර ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ වෙනයම් ස්ථානයක සිටියහොත් ඌ වහාම මරා දැමීමට පුළුවන් බව මෙයින් දන්වනු ලැබේ.

ආර්. අබේරත්න,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 පෙබරවාරි 21 වෙනි දින,
බදුල්ල කච්චේරියේදීය.

3-259—73.03.09 වැනි දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### මහජන බැංකුව

**(402 වැනි අධිකාරය වන) ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 74 වෙනි වගන්තිය සමග කියවෙන, 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 30 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය**

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1956 ලංකා නීති ප්‍රඥප්තියේ ප්‍රතිශෝධිත සංස්කරණයේ 402 වැනි අධිකාරය වූ) ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 71 වන වගන්තිය සමග කියැවෙන 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 30 වන වගන්තිය යටතේ සම්මත කරන ලදුව, 1972 මැයි මස 19 වන දින අංක 15,011 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහිද, 1972 මැයි මස 19 වන දින 'දවස' සහ 'සන්' පුවත්පත්වලද, පළවූ යෝජනාව අනුව පූර්වෝක්ත ආඥාපනතේ 78 වෙනි වගන්තිය ප්‍රකාර, විකුණන අවස්ථාවේදී අයවීමට තිබෙන මුළු මුදලේ ශේෂය, පොලිය, විකුණුම් වියදම් සහ අවශේෂ ගාස්තු ද වශයෙන් අයකර ගැනීමට ඇති සියළුම මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන දේපල රත්නපුර බලයලත් වෙන්දේසිකාර ඒ. එල්. ඒ. සමින් මහතා විසින් 1973 මැයි මස 26 වන දින පස්වරු 4 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ, හෙල උඩ පළාතේ මස්සැන්නේ පිහිටි රාවනාගිල් එස්ටේට් නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද 'ඒ1' දරණ කැබැල්ලට 1965 දෙසැම්බර් 1 වන දින ඩී. ඩබ්. ගුණරත්න මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 1386 දරණ පිතියම් කඩදාසියේ ප්‍රකාර මායිම් :— උතුරට: ගම්සභා පාරද, නැගෙනහිරට : මෙම ඉඩමේ 'බී' අක්ෂරය වශයෙන් බෙදා වෙන් කර ඇති කැබැල්ලද, දකුණට : මෙම ඉඩමේ 'බී' අක්ෂරය වශයෙන් බෙදා වෙන් කර ඇති කැබැල්ලද, බස්නාහිරට: මෙම ඉඩමේ 'ඒ' අක්ෂරය වශයෙන් බෙදා වෙන් කර ඇති කැබැල්ල ද යන මායිම් තුල පිහිටි රූඩ් දෙකයි පර්චස් හයක් (අ. 0, රූ. 2, පර්. 6) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි සහ තේ පැක්ටේරියට සාදා ඇති ගොඩනැගිල්ල, යන්ත්‍ර සූත්‍ර යනාදී සියලු දැයද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

පී. එච්. ඊ. ද සිල්වා,
ප්‍රධාන අයකිරීමේ නිලධාරි තැන.

මහජන බැංකුව,
මධ්‍යම අයකිරීමේ දෙපාර්තමේන්තුව,
යෝ. ඉ. ස. නි. ගොඩනැගිල්ල,
බ්‍රිස්ටල් වීදිය, කොළඹ 1,
1973 පෙබරවාරි මස 28 දින.

3-482—73.03.09 වැනි දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

ණය අංක 3509

### ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව

(402 අධිකාරය වන) කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව

1973 ජනවාරි 26 වෙනි දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

"ප්‍රසිද්ධ නොතාරිස්, එච්. සී. පී. ජයවර්ධන විසින් ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව නමට ලියා සහතික කරන ලද අංක 910 හා 69.10.07 දින දරණ බැඳුම්කරයෙහි සඳහන් ගෙවීම් මිනුවන්ගොඩ, මාතම්මන පදිංචි විතාන ආරච්චිගේ අමරාවතී නමැති අය විසින් පැහැර හැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය යටතේ රුපියල් දොලොස්දාස් පන්සිය හැත්තෑහයයි සත අටක (රු. 12,576.08) මුදලක් එකී සංස්ථාවට දැනට අයවිය යුතු හෙයින්ද, එකී අංක. 910 දරන බැඳුම්කරය මගින් එකී සංස්ථාවට උකස්කර ඇත්තාවූ එකිනෙකට යාව පිහිටා ඇති පහත සඳහන් ඉඩම් කැබලිවලින් සමන්විත :—

(1) පුත්තලම් දිස්ත්‍රික්කයේ, නුරෙයිචෝලෙයි ගමේ පිහිටි නුරෙයිචෝලෙයි වත්ත නමැති අ. 28, රූ. 0, ප. 0 ප්‍රමාණයෙන් යුත් ඉඩම එහි පිහිටි ගහකොළ සහ අනිකුත් සියළු දේ සහ

(2) එකී නුරෙයිචෝලෙයි ගමේ පිහිටි නුරෙයිචෝලෙයි වත්ත නමැති අ. 13, රූ. 0, ප. 13.50 ප්‍රමාණයෙන් යුත් ඉඩම එහි පිහිටි ගහකොළ සහ අනිකුත් සියළු දේ සමග,

බලයලත් මිනින්දෝරු, ඒ. ඇම්. පෙරේරා විසින් සකස් කරන ලද අංක 3892 හා 1951. 6. 26 දින දරන මිනින්දෝරු ප්ලෑනේ සඳහන් ලොට් බී1 දරන නුරෙයිචෝලෙයි නමැති ඉඩම, වගාව සහ දේපළ පුත්තලමේ පදිංචි බලයලත් වෙන්දේසිකරු වන පී. ටී. ඇම්. ඒ. නයිනා මරික්කාර් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමටත් එසේ විකුණා එකී !මුදල් හෝ එසේ විකුණන අවස්ථාවේදී එයින් ආපසු නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් සහ එවකට අයවිය යුතුව ඇති පොලියත්, එකී ආඥාපනතේ 78 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රචාරක, විකුණුම් හා වෙනත් ගාස්තුද සමග අයකර ගැනීමටත් කෘෂිකම් හා කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි."

එච්. ඇස්. ඇප්. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

1973 පෙබරවාරි 21, කොළඹ 3.

3-481—73.03.09 වැනි දින අංක 50 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතුනම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පලකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|
| මාර්තු | 73. 3. 2 සිකුරාද | ... | 73. 2.23 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද | ... | 73. 3. 2 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද | ... | 73. 3. 9 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද | ... | 73. 3.16 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද | ... | 73. 3.23 සිකුරාද | දහවල් 12.00 |
| අප්‍රේල් ... | 73. 4. 6 සිකුරාද | ... | 73. 3.30 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 4.11 බදාදා | ... | 73. 4. 6 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්ද | ... | 73. 4.11 බදාදා | දහවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද | ... | 73. 4.19 බ්‍රහස්පතින්ද | දහවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් 20 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයයි.